# අතීත ශ්‍රී ලංකාවේ අලි ඇතුන් ඇල්ලීම සඳහා යොදාගත් ක්‍රමවේද

**තාරක උමයංග දිල්ශාන් / සමාධි නවෝද්‍යා පීරිස් ***

අලියා යනු අතීතයේ ඉතා ඈත කාලයක සිටම මිනිසා හා මිනිස් සමාජය සමඟ ගනුදෙනු කළ මුල්ම සතුන්ගෙන් කෙනෙකි. මිනිසාගේ මුල්ම මිතුරා බල්ලා ලෙස පිළිගැනෙන නමුදු අලි මිනිස් සබඳතා සඳහා ද සැලකිය යුතු ඉතිහාසයක් පවතින බව පුරා විද්‍යාත්මක සාධක අනුව පැහැදිලි වේ. ලොව පැරණිතම ශිෂ්ටාචාරයක් වූ ඉන්දු නිම්න ශිෂ්ටාචාර කැණීම් භූමිවලදී හමු වූ කුඩා මුද්‍රාවල හස්ති සලකුණ දක්නට ලැබීම තුළින් එම ශිෂ්ටාචාරයේ වැසියන් අලි ඇතුන් පිළිබඳව දැන සිටි බව සනාථ වේ. එසේම ඔවුන් අලි ඇතුන් ආශ්‍රය කරන්නට ඇති බව ද උපකල්පනය කළ හැකිය. ශ්‍රී ලංකාවේ ද ප්‍රාග් ඓතිහාසික ලෙන් චිත්‍ර වශයෙන් හඳුනාගෙන ඇති ගල්ගුහා සිතුවම් අතර ද අලියෙකු ගේ හැඩය ගත් රූප දක්නට හැකිවේ. පුරා විද්‍යාත්මක මූලාශ්‍ර හැරුණු කොට ඓතිහාසික මූලාශ්‍ර හා ජනප්‍රවාදගත මූලාශ්‍ර ද ඉපැරණි මානව-හස්ති සබඳතා පිළිබඳ සාක්ෂි සපයනු ලබයි. නිදසුන් ලෙස මහාවංශය දක්වන දේවානම්පිය තිස්ස රජුගේ 'කුන්ජර' හා 'පදුම' ඇතුන් පිළිබඳ සටහන ඉපැරණි අලි මිනිස් සබඳතා පිළිබඳ වන ඓතිහාසික ලිඛිත මූලාශ්‍රමය සාධකයකි. ජනප්‍රවාදගත සාධකයක් ලෙස රාවණ රජුගේ 'ගර්ජන' නැමැති හස්තියා දැක්විය හැකිය. මේ අනුව පැහැදිලි වන්නේ සිරිලක මානව හස්ති සබැඳියාව චිරාත් කාලයක පටන් පැවත එන බවය. එසේ වුවත් හස්තීන් යනු මිනිසාට ඉබේ හීලෑ වූ සත්ත්ව කොට්ඨාසයක් නොවේ. අතීතයේ යම් දිනයක මිනිසා හස්තියාගේ ශක්තිය, ශක්‍යතාවය හා ප්‍රයෝජනවත්භාවය වටහා ගන්නට ඇති අතර අනතුරුව ස්වකීය බුද්ධිමහිමය යොදාගනිමින් මෙම තිරිසන් සත්ත්වයා තමන්ට නතුකර ගැනීමටත් තමන් හා හස්තියා අතර සංස්කෘතිකමය සබඳතාවක් නිර්මාණය කරගැනීමටත් කටයුතු කරන්නට ඇත. මිනිසා අලි ඇතුන් තමන්ට නතුකර ගැනීම සඳහා නැතහොත් වනයේ සැරිසැරූ මෙම සද්දන්තයින් ගෘහාශ්‍රිතකරණය කරගැනීම සඳහා ප්‍රධන වශයෙන් යොදාගත් ක්‍රම කිහිපයකි.

1. ඇත් ගාල් (Kraal)
2. මඳු ගැසීම (Noosing)

**මඳු ගැසීම**

ලක්දිව වන අලි හීලෑ කිරීම සඳහා අලි ඇල්ලීමේ ප්‍රකට ක්‍රමවේදය වනුයේ ඇත් ගාල් ක්‍රමයයි. නමුත් ඇත් ගාල් ක්‍රමය පනාමුරේ ඇත්ගාලෙන් පසු නැවතී ගිය හෙයින් අලි අල්ලා ගැනීමට වැඩිපුරම යොදාගනු ලැබුවේ මඳු ගැසීමයි. එනමුත් මඳු ගසා අලි ඇල්ලීම පිළිබඳ රාවණා කථා පුස්කොළ ග්‍රන්ථයේ ද තොරතුරු හමුවේ.

* තාරක උමයංග දිල්ශාන් / සමාධි නවෝද්‍යා පීරිස්
ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය, පුරාවිද්‍යාව - කැලණිය විශ්වවිද්‍යාලය,

අලි ඇතුන් ඇල්ලීම සිය විනෝදාංශය වූ මුරුන්ඩි රාජ වංශිකයන් පෙරියම්පුලි විල්ලුවට තණ කෑමට පැමිණි අලි ඇතුන් මදු ගසා අල්ලාගෙන හීලෑ කළ බව සඳහන්වේ. කෙසේ වෙතත් ඇත්ගාල් ක්‍රමය බිඳවැටීමෙන් අනතුරුව අලි ඇල්ලීම සිදු වූයේ ආණ්ඩුව විසින් අලි ඇල්ලීම සඳහා නිකුත් කරන ලද බලපත්‍ර මතය. වල් අලින් ඇල්ලීමේ මේ සාම්ප්‍රදායික ක්‍රමවේදය පිළිබඳ කථාකිරීමේ දී මෙම ක්‍රමවේදය පිළිබඳ විශේෂ දැනුමක් තිබූ පනික්කියන් නැමැති පිරිස පිළිබඳව සඳහන් කළ යුතුමය. මෙම ජන කොට්ඨාසය රටේ මුලින්ම ජීවත්ව සිටියේ මන්නාරම ප්‍රදේශයේ ය. මුස්ලිම් ජාතිකයින් හා මොවුන් ඕලන්ද යුගයේදී මෙරට අලි අල්ලන්නන් වශයෙන් ලියාපදිංචි කොට තිබී ඇත. මොවුන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය, මඩකලපු දිස්ත්‍රික්කය ආදී ප්‍රදේශවලට ගොස් අලි ඇල්ලීමේ කටයුතුවලට සහභාගීවී ඇති අතර එරාවුර් ආදී ප්‍රදේශවල මෙම ජාතිකයින් පදිංචි වී සිට ඇත. මොවුන් කැලයේ අලි ඇතුන් ඇල්ලීම සඳහා යොදාගත් ප්‍රධාන ක්‍රමය මුද ගැසීමයි. එනම් අලි ඇතුන් ගමන් කරන මංකඩවල් හා ජලය ලබාගැනීමට යන මාර්ගවල අඩි 02 පමණ ගැඹුරු වලක් කපා එම වල වටේට මන්ද රැඳවීමයි. ඒ රැහැනේ අනිත් කෙළවර සවිමත් ගසක බැඳගනී. මීට අමතරව එම කඹයේ මැද කොටසේ තවත් කඹයක් බැඳ එහි කෙලවර විශාල ගලක් ද බැඳ තබයි. මෙය සිදුකරනුයේ ඉතා සූක්ෂම ආකාරයෙනි. අලියෙකුගේ පාදයන් ඇතුලට වැටෙන තරම් විශාල ලෙස වල බිඳ මන්ද වටේට දමා වල්කොළ ආදියෙන් වසා උඩින් පස් ද ඉසිනු ලැබූ මේ බොරුවල හොඳින් නොදත් මිනිසෙකුට පවා හඳුනාගත නොහැකි ලෙස නිර්මාණය කරනු ලබයි. මෙවැනි මන්දකට හසු වූ අලියෙකු ඉන් මිදීම සඳහා දගලන විට ගල බැඳ තිබුණු කඹය තවත් හිරවීම නිසා එම අලියා තවත් මන්දට හිරවීම සිදුවේ. මෙහි දී අලියා සමග පැමිණි රැලේ අනිත් අලි පන්නා දමා අලියා සන්සුන් වූ පසු හීලෑ අලි මාර්ගයෙන් රැහැන් බුරුල් කොට කැලයෙන් එළියට ගෙනැවිත් ගස් බඳිනු ලබයි.

මට්ටයන් ලෙස හැඳින් වූ මෙම අලි ඇල්ලීමේ දක්ෂයන් වූවන් මේ වනයට ඇතුල්වීමට පෙර එම ප්‍රදේශයට අධිපති දෙවියන්ට කන්නලව් කිරීම සිදුකෙරේ. කොල අතු තබා එල්ලා භාරහාර වීම, පොල් ගැසීම ආදී කටයුතු ද සිදුකර ඇත. මදු ගැසීම් සිදුකරන්නේ ද නැකතට අනුවය. මෙම කටයුතු සිදුකිරීමට මට්ටයන් මෙන්ම දක්ෂ පළපුරුදු ඇත් ගොව්වන් සහ ශක්තිමත් හීලෑ අලි ඇතින්නියන් ද අලි හාම්පුතුන් විසින් රැගෙන යනු ලබයි.

ශ්‍රී ලංකාවේ මදු ගසා අලි ඇල්ලීමට අවසන් වරට රජය බලපත්‍ර නිකුත් කිරීම සිදුවූයේ 1975 වසරේදි ය. වර්තමානයේ ශ්‍රී ලංකාවේ සිටින හීලෑ අලින් බහුතරය මෙලෙස රජයේ බලපත්‍ර මත අල්ලාගන්නා ලද අලින්ය.

**ඇත් ගාල**

ලාංකීය රජ දවස පටන්ම හීලෑ කිරීම සඳහා අලින් අල්ලා ගැනීමට භාවිතා කරන ලද ක්‍රමයක් වනුයේ ඇත් ගාල් ක්‍රමයයි. ඇත් ගාලක් සංවිධානය කිරීම විශාල බැරෑරුම් මෙන්ම දැවැන්ත කාර්යය භාරයකි. බොහෝ විට ඇත් ගාල් සංවිධානය කරනුයේ වියළි කාලයට ය. විශාල කාලයක් පුරාවට මිනිස්සු ඇත් ගාල නිර්මාණය කිරීමට වෙහෙසෙති. අලි ඇතුන් ගාල් කිරීමට සකස් කරන ගාල අක්කර කීපයක භූමියක් අයත් වන සේ දඬුවැටකින් කොටු කරයි.

අතීතයේ මේ කටයුතු සංවිධානය කරගැනීමට ඇත් ගාල් සංවිධානය කරන ප්‍රභූවරු ඒ සඳහා සිය නින්ද ගම් වැසියන්ගේ සහාය ලබාගත්හ. ඔවුහු එලෙස කටයුතු කර දීමට නීතියෙන්ම බැඳී සිටියහ. ගාල සඳහා වෙන්කර ගන්නා ලද භූමියේ ගාල් වැට ඉදි කළ යුතුය. අලි ඇතුන් ගමන් ගන්නා පාර එහි පැත්තකින් විවෘතව තිබෙන සේ අනෙක් සෑම පැත්තකින්ම ඇහිරෙන සේ ගාල් වැට ඉදිකරනු ලබයි. ඇත් ගාලේ වැට ඉදිකිරීම ඇතුළු ඇත් ගාල තැනීමේ කටයුතු ආරම්භ කරනුයේ සුභ මොහොතකිනි. නැකැත් සහ ඒ හා සම්බන්ධ වූ චාරිත්‍ර ඉටුකොට එය ආරම්භ කරනු ලබයි. ඉතා විශාල දැව කණු, කැලයෙන් කපාගන්නා බුරුත, මිල්ල වැනි ශක්තිමත් දැව වර්ග යොදාගෙන ගාල් වැට නිර්මාණය කරයි. කණු සිටවා ඒ අතරට හරස් ලී බඳිනු ලබයි. මෙම ලී බඳිනු ලබන්නේ ඒ සඳහාම අඹරවාගත් රැහැන්වලිනි. ඒ වගේම ශක්තිමත් වැල් වර්ග හා පට්ට වර්ග යොදාගත් බව ද තතු දත් පුද්ගලයෝ පවසති. ගාල තනා නිම වූ පසු අලි එලවීමේ රාජකාරිය එළඹේ. ගිනි පන්දම් අතින්ගත් පිරිස් සහ බෙර දවුල් වාදකයින් ඝෝෂා කරමින් අලි රංචු ගාල දෙසට පළවා හැරීම සිදුකරයි. අලි රංචුව කොටුව තුළට ගාල් වූ පසු ගාල වසා දැමීම සිදුකරයි. ඇත්ගාල් කිරීමේ දී දේව ඇදහිලි, නැකැත් හෝරාවන් ආදිය පිළිබඳව දැඩි අවධානයක් යොමු වූ බව පෙනෙන්නට ඇත. ඇත්ගාල් සිදුකරන ප්‍රදේශ එම කාලයට ඉතා කාර්ය බහුල වූ බව ද පෙනෙන්ට තිබේ. එය තාවකාලික නගරයක ස්වරූපයක් ඉසුළූ බවට සාක්ෂි හමු වේ. අලි ගාල් කිරීමට පැමිණෙන ජනතාව නිසාත් ඔවුනට අවශ්‍ය දෑ සැපයීමට ඉදි වූ වෙළඳසැල් ප්‍රභූන්ට නැරඹුම් ස්ථාන හා නවාතැන් ගැනීමට ඉදි වූ තාවකාලික ලැගුම්හල් නිසා එසේ වන්නට ඇත. අතීතයේ ඇත් ගාල් කිරීම හා සම්බන්ධව වෙනම තනතුරු බිහි වී ඇත. අලි ඇල්ලීම හීලෑ කිරීම ආදී කටයුතු රජු දවස කුරුවේ කාර්යංශය නමින් වූ වෙනම අංශයකට පවරා දී තිබී ඇත. කුරුවේ කාර්යංශය රජතුමා විසින් විශේෂයෙන් පත්කරන ලද කුරුවේ ලේකම් නම් උසස් ප්‍රධානියා යටතේ වූහ. මේ සියලු කටයුතු වූයේ ගජනායක නිළමේ යටතේය. ඔවුන් යටතේ වූ කාර්ය මණ්ඩලය ලෙස,

කුරුවේ මුදලිවරු

වගච්චි

විදානෙරාළ හෙවත් පටන්ගනී

බෙත්මෙ රාළ

කන්කානම්

මූකරයින්

පනික්කිරාළ නම් වේ.

රොඩී කුල ගෝත්‍රයට ගස්මන්දා නම් තනතුරක් වූ අතර ඔහුගේ කාර්යය වූයේ ඇත් ගාල් සඳහා හම් කඹ සැපයීමයි.

ඇත් ගාල තුළට කොටු වූ අලි ඇල්ලීම සිදුකරනුයේ ඊටම පුරුදු පුහුණු වූ හීලෑ අලින් ලවාය. හීලෑ අලි දෙදෙනෙකුට මැදිකර හිරකර තබාගන්නා වල් අලියා ඇත් ගොව්වන්ගේ ආධාරයෙන් කඹ යොදා බැඳගනී. එසේ කඹ යොදා හිරකර ගන්නා අලියා හීලෑ අලි ආධාරයෙන්ම ගස් බැඳ ගැනීම සිදුකරයි.

නවපොටවිලංගුව ආදිය යොදා ගස් බැඳ ගන්නා වල් අලින් සංසුන් වූ පසු ගාල් භූමියේදී ම ප්‍රසිද්ධියේ වෙන්දේසි කරනු ලැබේ. මෙලෙස වෙනදේසියේ දී මිලදී ගන්නා අලින්ව අලි හිමිකරුවන් විසින් හීලෑ අලි ඇත්තු දෙදෙනෙකුට මැදිකොට බැඳ තැබූ ගහෙන් ලෙහා හීලෑ අලින්ගේ කරේ ආදනු ලැබේ. ඉන් පසු සිය ගම් ප්‍රදේශ දක්වා පයින් රැගෙන යාම සිදුකරනු ලබයි.

**ලක්දිව පැවති ඇත් ගාල්**

| | | |
|---|---|---|
| 1820 | ගල්කඩවල ඇත් ගාල | (කලා ඔය අසල) |
| 1840 | නිල්ලෙගොඩ ඇත් ගාල | (ටොරින්ටන් ආණ්ඩකාරවරයා) |
| 1857 | කිඹුලුවාව ඔය අසල | (වයඹ පළාත) |
| 1859 | නෙල්ලුගොල්ල ඇත් ගාල | |
| 1860 | රුවන්ගිරිකන්ද ඇත් ගාල | |
| 1863 | ඉබ්බාවලපිටිය ඇත් ගාල | |
| 1866 | නෙල්ලුගොල්ල ඇත් ගාල | (හර්කියුලස් රොබින්සන්) |
| 1870 | ඉබ්බාවලපිටිය ඇත් ගාල | (එඩින්බරෝ ආදිපාදවරයා පැමිණ ඇත) |
| 1871 | තිරාගම ඇත් ගාල | (කඩිගමුව රටේ මහත්තයා) |
| 1881 | ලබුගම ඇත් ගාල | (7 වන එඩ්වඩ් රජු සහ ඔහුගේ සහෝදරයා පැමිණ ඇත) |
| 1883 | වයඹ පළාතේ | (ආතර් ගෝඩන් ආණ්ඩුකාරවරයා පැමිණ ඇත) |
| 1887 | ලේනාවෙ ඇත් ගාල | (ආතර් ගෝඩන් ආණ්ඩුකාරවරයා) |
| 1896 | දඬුවැව ඇත් ගාල මහත්තයා | (වෙස්ට් රිජ්වේ ආණ්ඩුකාරවරයා බෝගහලන්ද රටේ විසින් කරවා ඇත. අලි 5 අල්ලාගෙන ඇත) |
| 1902 | පළුගොල්ල ඇත් ගාල | (හුළුගල්ලේ දිසාවෙ විසින් සිදු කර ඇත) |
| 1907 | පනාමුරේ ඇත් ගාල | (වෙස්ට් රිජ්වේ ආණ්ඩුකාරවරයා) |
| 1920 | අඹන්පොළ ඇත් ගාල | සර් විලියම් මැනිං ආණ්ඩුකාරවරයා |
| | | (පී. බී. මඩහපොල රටේ මහත්තයා විසින් සිදු කර ඇත) |

1924 ගල්ගමුව කුරුණෑගල ඇත් ගාල

1950 පනාමුරේ ඇත් ගාල